# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


**මැතිවරණ දින මාධ්‍ය නිවේදනය**

**2025 පළාත් පාලන මැතිවරණය**

**2025 මැයි 06**

2025 පළාත් පාලන ඡන්ද විමසීම වසර 2025 ක් වූ මැයි මස 06 වන දින දිවයින පුරා පළාත් පාලන ආයතන 339 ක් (මහා නගර සභා 28 ක්, නගර සභා 36 ක් සහ ප්‍රාදේශීය සභා 275 ක්) ආවරණය කරමින් පැවැත්විණි. එය වසර හතකට පසුව පැවති මෙවැනි ආකාරයේ පළමු මැතිවරණය වූ අතර, නව රජය යටතේ පවත්වන ලද පළමු පළාත් පාලන මැතිවරණය වශයෙන්ද එය සනිටුහන් වේ. ඡන්ද මධ්‍යස්ථාන 13,759 ක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද දායකයින් 17,156,338 ක් සුදුසුකම් ලබා සිටියහ. දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලින් අපේක්ෂකයින් 75,589 ක් මැතිවරණයට ඉදිරිපත් විය. කෙසේ වෙතත්, ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය ඉතා ඉහළ මට්ටමක නොපැවති අතර එය 55-60% අතර දක්නට ලැබිණි.

ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ සාමකාමී මෙන්ම විධිමත් පරිසරයක් තුළ මැතිවරණය සාර්ථක ලෙස පවත්වන ලද අතර, මැතිවරණ අපේක්ෂකයින්, විවිධ දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මැදිහත් වූ හුදෙකලා සිදුවීම් කිහිපයක් ව්‍යතිරේක වශයෙන් වාර්තා විය. මැතිවරණ කොමිෂන් සභාව පිළිගත් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඇතුළු ප්‍රධාන පෙළේ පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් කටයුතු කළ අතර, මැතිවරණ ක්‍රියාවලිය විනිවිද භාවයෙන් යුත් බවට, සියලු පාර්ශවයන් ඇතුළත් කර ගත් බවට සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන බවට සහතික කරන ලදී. පූර්ව මැතිවරණ සමයේ සිට මැතිවරණ දිනය දක්වා, මැතිවරණයේ ස්වාධීනත්වය සහ සාධාරණත්වය සහතික කිරීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් පුළුල් පියවර ගෙන තිබිණි. මැතිවරණ ක්‍රියාවලිය පුරාම අදාළ ආයතන සමග සමීප සම්බන්ධීකරණයෙන් යුක්තව ක්‍රියාත්මක වෙමින් නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය ඉටු කළ කාර්යභාරයද තීරණාත්මක විය. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය තුළින් වෘත්තීයභාවය, මධ්‍යස්ථභාවය මෙන් ම මැතිවරණ කටයුතු පාලනය කෙරෙන නීතිමය සහ නියාමන රාමුවට දැඩි ලෙස අනුගත වීම යන කරුණු විද්‍යමාන විය. මැතිවරණයට තරග කළ සියලුම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් මෙන්ම පුරවැසියන්ද ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සඳහා දක්වන ලද කැපවීම ස්වාධීන මෙන් ම සාමකාමී මැතිවරණ ක්‍රියාවලියක් සහතික කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර, එය අගය කල යුත්තකි.

මැතිවරණය සඳහා අරමුදල් නොමැති බවට සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සමක් ගොනු කිරීමද ඇතුළුව පළාත් පාලන මැතිවරණය කල්දැමීමට උත්සාහයන් කිහිපයක්ම පැවති අතර, එවන් කල්දැමීමක් තුළින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙන බවට දක්වමින් නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ව්‍යාපාරය (පැෆ්රල් සංවිධානය), ජාතික ජන බලවේගය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් එම කල්දැමීම අභියෝගයට ලක් කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට කටයුතු කරන ලදී. 2024 අගෝස්තු මාසයේදී, මැතිවරණය කල්දැමීම තුළින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහ ජනතාවගේ ස්වෛරීභාවය උල්ලංඝනය කෙරෙන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ අතර, මේ සඳහා මැතිවරණ කොමිෂන් සභාව සහ ජනාධිපතිවරයා වගකිව යුතු බවටත්, ඒ අනුව මැතිවරණය කඩිනමින් පැවැත්වීමට කටයුතු කරන ලෙසටත්, නියෝග කරන ලදී.

ඡන්ද මධ්‍යස්ථාන අතුරින් සැලකිය යුතු සංඛ්‍යාවක් පැෆ්රල් සංවිධානය විසින් ආවරණය කළ අතර, මැතිවරණ නිරීක්ෂකයින් 3,000 කගේ ක්‍රියාකාරී සහභාගීත්වය ද ඊට ඇතුළත් විය. මැතිවරණ දිනය තුළ පැෆ්රල් සංවිධානය වෙත පැමිණිලි 119 ක් (තහවුරු කරන ලද පැමිණිලි 80 ක් සහ තහවුරු නොකළ පැමිණිලි 39 ක්) ලැබී තිබේ. මේ අතරින් පැමිණිලි 116 ක් නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ කටයුතු සහ ඡන්දදායකයින්ට බලපෑම් කිරීමට උත්සාහ කිරීම ඇතුළු මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විය.


**#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.**

**Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572**

**Email : paffrel@sltnet.lk Web : www.paffrel.com**

රත්ගම, කෝට්ටේ, යාපනය, කිලිනොච්චිය, කැස්බෑව, අනුරාධපුරය, බදුල්ල, වෙන්නප්පුව, නාඋල, හම්බන්තොට, පූඩළුඔය, කොළඹ, කළුතර, කුලියාපිටිය, බියගම, ගාල්ල, හික්කඩුව, මඩුකන්ද, නොච්චියාගම, මාතර, කටාන, සියඹලාපිටිය, මතුගම, බේරුවල, යටියන්තොට සහ අවිස්සාවේල්ල යන ප්‍රදේශවලින් මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිද්ධීන් කිහිපයක් වාර්තා විය. නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල නිරත වීම සහ මැතිවරණ දිනය තුළ ඡන්දදායකයින් ප්‍රවාහනය කිරීමේ සිට ඡන්දදායකයින්ට බලපෑම් කිරීම දක්වා මෙම සිදුවීම් පැතිර පවතී. නොරොච්චෝලේ, පුත්තලම සහ දැරණියගල යන ප්‍රදේශවලින් ප්‍රචණ්ඩ ක්‍රියා ලෙස සැලකෙන සිදුවීම් තුනක් වාර්තා විය. කෙසේ වුවද, මැතිවරණ දිනය තුළ ඡන්ද විමසීමට සැලකිය යුතු මට්ටමේ බලපෑමක් ඇති කළ සිදුවීම් හෝ තත්වයන් කිසිවක් වාර්තා නොවීය. පූර්ව මැතිවරණ අවදියේ සිට ඡන්ද විමසීමේ දිනය දක්වා රාජ්‍ය බලය, සම්පත් මෙන් ම රජයේ සේවකයින් අවභාවිතා කිරීම සම්බන්ධ සිදුවීම් සහ පැමිණිලි හුදෙකලා වශයෙන් වාර්තා වී තිබීම වැදගත් වන අතර එම අක්‍රමිකතා තුළින් ඡන්දදායකයින්ගේ හැසිරීමට සිදුවූ බලපෑම තවමත් තීරණය කර නොමැත.

ඡන්ද විමසීමේ දිනයේදී පැෆ්රල් සංවිධානය විසින් යෙදවූ ජංගම රථ නිරීක්ෂකයන්, දිගුකාලීන නිරීක්ෂකයන් මෙන්ම ස්ථානගත නිරීක්ෂකයින් ඇතුළු මැතිවරණ නිරීක්ෂකයින් විසින්, මැතිවරණ දිනය මුළුල්ලේ අඛණ්ඩව ඡන්දදායකයින් ඡන්ද මධ්‍යස්ථාන වෙත පැමිණෙන බවට වාර්තා කළ අතර, ඡන්ද මධ්‍යස්ථාන සහ ඒ අවට ප්‍රදේශයන්හී දිගු පෝලිම් හෝ අධික ජනකායක් එක්රැස්ව නොසිටි බවටද වාර්තා කරන ලදී. පැෆ්රල් සංවිධානයේ ස්ථානගත  නිරීක්ෂකයින් විසින් ඡන්ද මධ්‍යස්ථාන අතුරින් 25%ක් පමණ ආවරණය කළ අතර තවත් 25% ක් ජංගම නිරීක්ෂකයින් විසින් නිරීක්ෂණය කළහ. ව්‍යතිරේකයන් කිහිපයක් සහිතව ඡන්ද මධ්‍යස්ථානවල ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රමාණවත් පහසුකම් ද සපයා තිබිණි. විශේෂයෙන් රටේ ඇතැම් ප්‍රදේශවල ප්‍රවේශ්‍යතා ගැටළු පැෆ්රල් සංවිධානය විසින් නිරීක්ෂණය කොට ඇති අතර, අනාගතයේදී ඡන්ද මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ පියවර ගන්නා ලෙස මැතිවරණ කොමිෂන් සභාව වෙතින් ඉල්ලා සිටී. ඡන්ද මධ්‍යස්ථාන අවට නීති විරෝධී මැතිවරණ ව්‍යාපාර, මහජන රැස්වීම්, බිය ගැන්වීම් සහ ඡන්දදායකයින්ට බලපෑම් කිරීම සහ ඡන්දදායකයින් ප්‍රවාහනය සම්බන්ධයෙන් බරපතල සිදුවීම් වාර්තා වී නොමැත. සමස්ථ මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ දිනයට අදාළ කටයුතු කළමනාකරණය බාධාවකින් තොරව සාමකාමීව පැවති අතර, මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශ කිරීම සහ පළාත් පාලන ආයතන පිහිටුවීම තෙක් සියලුම පාර්ශවකරුවන්ගේ මෙම සාමකාමී හැසිරීම දිගටම පවතිනු ඇතැයි පැෆ්රල් සංවිධානය බලාපොරොත්තු වේ.

2025 පළාත් පාලන මැතිවරණයේදී මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා ඍජුවම සම්බන්ධ වූ බලධාරීන් විසින් ධනාත්මක පියවර කිහිපයක් ගෙන තිබිණි. ඒ අනුව මැතිවරණ පැමිණිලි ඉක්මනින් වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් Electµon Dispute Resolution (EDR)-EC EDR නමින් සරල හා කාර්යක්ෂම ජංගම දුරකථන යෙදුමක් හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

ආබාධ සහිත තැනැත්තන් මැතිවරණ කටයුතු සඳහා ඇතුළත් කර ගනු ලබන බවට සහතික කිරීම පිණිස, ඔවුන් හට විශේෂ හැඳුනුම්පතක් ලබා දීමට, දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා ස්පර්ශක ඡන්ද මාර්ගෝපදේශ හඳුන්වා දීමට සහ රෝද පුටු භාවිතා කරන්නන් සඳහා ප්‍රවේශ විය හැකි ඡන්ද පෙට්ටි ස්ථානගත කිරීම ඇතුළු ප්‍රධාන පියවර හඳුන්වා දීමට මැතිවරණ කොමිෂන් සභාව මැදිහත් විය. දිගු දුරක් ඇවිදීමට නොහැකි අය සඳහා ඡන්ද පරිශ්‍රයන් තුළ නොමිලේ ප්‍රවාහන සේවා සපයන ලද අතර, පළමු වරට අර්ධ දෘශ්‍යාබාධිත ඡන්දදායකයින්ට තම ඡන්ද පත්‍රිකා ස්වාධීනව සලකුණු කිරීමට සහාය වීම සඳහා පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලික දෘශ්‍යාධාරක භාවිතා කිරීමට අවසර දෙන ලදී. ආබාධ සහිත තැනැත්තන් සමාන හා සාධාරණ පදනමක් මත මැතිවරණ ක්‍රියාවලියට ඇතුළත් කෙරෙන බව සහතික කිරීම සඳහා මෙන් ම ඔවුන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ප්‍රගතිශීලී පියවර සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිෂන් සභාවට සිය අවංක කෘතඥතාව පළ කරයි. මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකොට ඇති මුලපිරීම් පැෆ්රල් සංවිධානය විසින් පිළිගන්නා අතර, එකී මුලපිරීම් අඛණ්ඩව වැඩිදියුණු කරන ලෙස ඉල්ලා සිටී.

අපේක්ෂකයින්ට සහාය දැක්වීම පිණිස සිදු කරන ලද මැතිවරණ ව්‍යාපාර සඳහා සමාජ මාධ්‍ය වේදිකා බහුලව භාවිතා කරන ලද අතර, පුරවැසියන් ද සමාජ මාධ්‍ය නාලිකා ඔස්සේ මැතිවරණ ව්‍යාපාරවලට ඉතා හොඳින් සම්බන්ධ වී උද්‍යෝගිමත්ව කටයුතු කළ බව දක්නට ලැබිණි. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අධීක්ෂණ මුලපිරීම් තීරණාත්මක වූ අතර පැෆ්රල් සංවිධානය හැෂ් ටැග් පරපුර සමග සහයෝගයෙන් එවැනි මුලපිරීම් සඳහා සහාය දක්වන ලදී. ඒ අනුව, පැෆ්රල් සංවිධානය විසින් පූර්ව මැතිවරණ අවදිය තුළ ප්‍රචාරක අන්තර්ගතයන් 717 ක් ද, මැතිවරණයේ නිහඬ කාලය තුළ ප්‍රචාරක අන්තර්ගතයන් 667 ක් සහ ෆෙස්බුක් වෙත මුදල් ගෙවා සිදු කල ප්‍රචාරක අන්තර්ගතයන් 108 ක් මෙන් ම මැතිවරණ දිනය තුළ ප්‍රචාරක අන්තර්ගතයන් 130 ක් මැතිවරණ කොමිෂන් සභාව සමඟින් බෙදා ගැනීමට කටයුතු කරන ලදී.

ගන්නෝරුව කනිෂ්ඨ විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානයක තම රාජකාරිය ඉටු කරමින් සිටියදී මියගිය රජයේ නිලධාරිනියගේ පවුලේ සාමාජිකයන් සඳහා පැෆ්රල් සංවිධානය සිය බලවත් ශෝකය පළ කරයි.

පැෆ්රල් සංවිධානය සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන්, මැතිවරණ නිරීක්ෂකයින් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නොසැලෙන කැපවීම මෙන් ම ස්වේච්ඡා සේවය කෘතඥතාවයෙන් යුතුව සිහිපත් කරයි. මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුමේ සාර්ථකත්වය සහතික කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ නොපසුබට දායකත්වය ඉවහල් වී තිබේ.

පූර්ව මැතිවරණ අවදියේ සිට මැතිවරණ දිනය දක්වා, දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 40 දෙනෙකු, ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 25 දෙනෙකු, ස්ථානගත නිරීක්ෂකයින් 2,300 දෙනෙකු (ගණන් කිරීමේ/වගුගත කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් ලෙස) සහ ජංගම නිරීක්ෂකයන් 800 දෙනෙකු හරහා ජංගම රථ නිරීක්ෂණ කණ්ඩායම් 200 ක්, මෙන් ම දිගු කාලීන නිරීක්ෂකයින් 160 දෙනෙකු සමඟ පැෆ්රල් සංවිධානය මැතිවරණ නිරීක්ෂණ කටයුතු දිගටම පවත්වා ගෙන යන ලදී. මැතිවරණයන්හි ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය පවත්වා ගැනීම සඳහා, පැෆ්රල් සංවිධානය අඛණ්ඩව මැදිහත් වේ. පශ්චාත් මැතිවරණ කාලය තුළ සුපරීක්ෂාකාරීව හා සන්සුන්ව සිටින ලෙස සියලුම පුරවැසියන්, දේශපාලන ක්‍රියාකාරීන් මෙන් ම බලධාරීන් වෙතින් පැෆ්රල් සංවිධානය ඉල්ලා සිටී.

රෝහණ හෙට්ටිආරච්චි,

විධායක අධ්‍යක්ෂ